# පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදනය හා එයට හවුල්වන ගොවි ජනතාව

***ඩබ්ලිව්. එම් ජේ. බී ගිරාගම***
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය අතින් පොළොන්නරුව දිස්ත්‍රික්කය ප්‍රමුඛස්ථානයක් ලබයි. මෙම දිස්ත්‍රික්කයේ 1990/91 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 1,70,000 ක් නිෂ්පාදනය කර ඇති අතර, එය දෙවැනි වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයට පමණි. මෙය ලංකාවේ එම කන්නය තුළ නිෂ්පාදනයෙන් 10.94% ක් පමණ වේ. එමෙන්ම මෙම දිස්ත්‍රික්කයේ ඒකපුද්ගල වී නිෂ්පාදනය මෙම කන්නය තුළ මෙට්රික් ටොන් 0.65 ක පමණ ඉහළ මට්ටමක පවතී. කුරුණෑගල, අනුරාධපුර හා අම්පාර දිස්ත්‍රික්කවල මෙම අගයයන් 0.21, 0.17 හා 0.35 වේ. මෙයින් හැගෙනුයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල වී නිෂ්පාදනය ඉහළ මට්ටමක් පවතින බව හා පරිභෝජනයට වඩා වැඩි ඉතිරියක් ඇති අස්වැන්නක් ලැබෙන බවත්ය.

සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 1990/91 මහ කන්නයේ දී හෙක්ටයාර් 43;659 ක වී වගා කර ඇති අතර, එයින් 95.44% ක් ම විශාල වාරිමාර්ග මගින් ද, 1.2% ක් සුළු වාරිමාර්ග මගින් ද, 3.36% ක් වර්ෂා ජලයෙන් ද පෝෂිත කුඹුරු වේ. විශාල වාරිමාගී, සුළු වාරිමාර්ග හා වර්ෂාපෝෂිත කුඹුරුවල සාමාන්‍ය අස්වැන්න පිළිවෙළින් හෙක්ටයාරයට කි. ග්‍රෑම් 4492, 3489 හා 3083 බැගින් වේ.

1982 වර්ෂයේ කෘෂිකාර්මික සංගණනයට අනුව (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) මෙම දිස්ත්‍රික්කය තුළ ජනගහනය 261,563 ක් වූ අතර ඉන් 92% ක්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන බව පෙනේ. ඔවුන් අතර ඉඩම් හිමි ගොවීන් ප්‍රමාණය 12% ක් පමණ වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ උප දිසාපති කොට්ඨාශ අනුව ජනගහණය හා ඉඩම් අයිතිය පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

**1982 දි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උපදිසාපති කොට්ඨාශ වල ජනගහණය හා කුඩා ඉඩම් අයිතිය.**

| උප දිසාපති කොට්ඨාශය | ජනගහණය | කුඩා ඉඩම් වගා කරන්නන් | වතු අංශය | වගාකරන මුළු අක්කර ගණන |
|---|---|---|---|---|
| ඇලහැර | 32,334 | 4,645 | 05 | 15,652 |
| සිංහල පත්තුව (හිඟුරක්ගොඩ) | 62,994 | 6,276 | 02 | 25,390 |
| ලංකාපුර | 41,344 | 5,265 | - | 22,990 |
| මැදිරිගිරිය | 50,897 | 8,364 | - | 25,035 |
| තමන්කඩුව | 73,994 | 7,672 | 10 | 42,874 |
| දිස්ත්‍රික්කයේ මුළු | 261,563 | 32,222 | 17 | 131,941 |

1982 වර්ෂයේ දි කෘෂිකාර්මික කටයුතුවල නියැලුනු 32,222 දෙනාගෙන් 28,618 ක් ම පිරිමින් වූ අතර 3604 ක් ස්ත්‍රීන් විය.

1982 කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන අනුව පොළොන්නරුව දිස්ත්‍රික්ක යේ කෘෂිකාර්මික කටයුතු වල නියැලී සිටින ජනගහණය වයස් ව්‍යුහය අනුව පහත වගුවෙන් දැක්වේ.

**පොළොන්නරුව දිස්ත්‍රික්ක යේ කෘෂි කටයුතුවල නියැලෙන්නන්ගේ වයස් හා ස්ත්‍රී පුරුෂ ප්‍රභේද අනුව.**

| | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|
| වයස් පරාසය | ජනගහණය | කෘෂි කටයුතුවල යෙදෙන ප්‍රතිශතය | ජනගහණය | කෘෂි කටයුතුවල යෙදෙන ප්‍රතිශතය |
| අවු: 20 ට අඩු | 66882 | 0.12 | 59419 | 0.02 |
| 20 - 24 | 19139 | 5.59 | 12703 | 0.82 |
| 25 - 34 | 27043 | 28.09 | 18509 | 3.36 |
| 35 - 44 | 15147 | 50.08 | 10.350 | 8.26 |
| 45 - 54 | 10422 | 57.42 | 6642 | 14.39 |
| 55 - 64 | 5829 | 62.52 | 3236 | 19.31 |
| 65 ට වැඩි | 3899 | 61.48 | 2343 | 19.76 |
| එකතුව : | 148,361 | | 113,202 | |

*මූලය : සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ඉහත වගුවට අනුව පුරුෂයින්ගෙන් උපරිම ප්‍රතිශතයන් කෘෂිකාර්මික කටයුතුවල යෙදෙනුයේ අවුරුදු 55 - 64 වයස් පරාසය තුළ වන අතර, අවු: 25 - 34 පරාසය තුළ උපරිම සංඛ්‍යාවක් (7597 ක්) කෘෂිකාර්මික කටයුතු වල නියැලේ. ස්ත්‍රීන්ගේ කෘෂිකාර්මික කටයුතු වල යෙදීම සාපේක්ෂව අඩු බව පෙනේ. ස්ත්‍රීන්ගේ ප්‍රතිශතයක් කෘෂිකාර්මික කටයුතුවල යෙදෙනුයේ අවුරුදු 65 ට වැඩි උපරිම සංඛ්‍යාවක් (956) කෘෂිකාර්මික කටයුතුවල යෙදෙනුයේ අවුරුදු 45 - 54 පරාසය තුළ සිටින අයයි.

1982 සංගණනයේ සංඛ්‍යාලේඛන අනුව මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන්නන් ගේ අධ්‍යාපන මට්ටම පහත දැක්වේ.

**අධ්‍යාපන මට්ටම් අනුව ගොවීන් බෙදියන අයුරු**

| අධ්‍යාපන මට්ටම | ගොවීන් සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| පාසැල් නොගිය | 4610 | 14.3 |
| 5 වන ශ්‍රේණියට අඩු | 15414 | 47.8 |
| 6 - 9 ශ්‍රේනි අතර | 9131 | 28.3 |
| අ. පො. ස. (සා. පෙ.) දක්වා | 2526 | 7.8 |
| අ. පො. ස. (උ. පෙ) දක්වා | 315 | 1.0 |
| උසස් අධ්‍යාපනය ලැබූවන් | 141 | 0.5 |
| වර්ග නොකළ | 85 | 0.3 |
| එකතුව | 32,222 | 100 |

*මූලය : සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.*

1982 සංගණනයට අනුව ඉඩම් අහිමි ගොවීන් 9487 ක් ද, ගෙවත්ත පමණක් හිමි ගොවීන් 5334 ක් (අක්කර 6436) හා ගෙවත්තත් තවත් ඉඩම් ද ඇති ගොවීන් 16318 ක් ද, (අක්කර 78,623) වෙනත් ඉඩම් පමණක් හිමි ගොවීන් 1076 (අක්කර 3473) ක් ද සිටියහ.

1982 සංගණනය ට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගෙවතු අක්කර 35847 ක් ද, කුඹුරු අක්කර 67339 ක් ද හා උස්බිම් අක්කර 8003 ක් ද තිබුණි කුඹුරු ඉඩම් වලින් 75.2% ක් හිමිකරු අක්කර විසින් වගාකළ අතර 19.3% ඉඩම් හිමියා නොවන වෙනත් ගොවීන් වගාකළ අතර, 5.5% ක් ඉඩම් හිමියා හා වෙනත් ගොවීන් හවුල් වී වගා කරන ලදී. අක්කර 1 ට අඩු ප්‍රමාණයේ කුඹුරු අක්කර 1139 ක් ද, අක්කර 1 හා 5 අතර ප්‍රමාණයේ කුඹුරු අක්කර 41780 ක් ද, අක්කර 5 - 10 අතර කුඹුරු අක්කර 20,210 ක් ද ඊට වඩා වැඩි විශාලත්වයක් ඇති, කුඹුරු බිම් අක්කර 4210 ක් ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබේ. මෙම දිස්ත්‍රික්කයේ ඉඩම්වලින් අක්කර 46906 ක් කෘෂිකාර්මික වගාවන් සඳහා පමණක් උපයෝගී කරගෙන ඇති අතර, අක්කර 62187 ක් සත්ව පාලනය හා වගාකටයුතු යන දෙකම සඳහා යොදා ගෙන ඇත. ඊට අමතරව අක්කර 2146 ක් සත්ව පාලන කටයුතු සඳහා පමණක්ම යොදා ගෙන තිබේ.

දේශීය ආහාර නිෂ්පාදනයට පසුගිය දශකය තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලබාදී ඇති දායකත්වය පහත වගුවෙන් විස්තර කරයි.

**පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආහාර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් වලින්**

| වර්ෂය | වී | බඩ ඉරිඟු | මුං‍ඇට | රටකජු | මිරිස් |
|---|---|---|---|---|---|
| 1982 | 182854 | 339 | 285 | 111 | 1326 |
| 1983 | 257362 | 481 | 455 | 133 | 1352 |
| 1984 | 191632 | 645 | 322 | 221 | 4797 |
| 1985 | 234393 | 724 | 346 | 392 | 5819 |
| 1986 | 243066 | 524 | 463 | 409 | 9147 |
| 1987 | 242628 | 669 | 593 | 399 | 3779 |
| 1988 | 258282 | 562 | 514 | 389 | 3852 |
| 1989 | 251928 | 437 | 1122 | 718 | 5520 |
| 1990 | 291000 | 409 | 970 | 739 | 6108 |
| 1991 | 304000 | 388 | 764 | 272 | 10587 |

*මූලය : සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ඉහත වගුවට අනුව මෙම දිස්ත්‍රික්කය තුළ වී නිෂ්පාදනය ක්‍රමයෙන් වැඩිවී ඇති බව පෙනෙන අතර, බඩඉරිඟු, මුං‍ඇට හා රටකජු නිෂ්පාදනය වැඩිවී පසුව අඩුවී ඇති බව පෙනී යයි. මෙයට හේතුව වී ඇත්තේ වගා කරන ලද බිම් ප්‍රමාණය වාර්ෂිකව වෙනස් වීමයි. මිරිස් නිෂ්පාදනය උච්චාවචනයන්ට ලක් වුවද දිගුකාලීනව නිෂ්පාදනයේ වැඩිවීමක් පෙන්නුම් කරයි.

යල කන්නයට වඩා වී වගා කරන බිම් ප්‍රමාණය මහ කන්නයේදී වැඩි අතර, බඩඉරිඟු සඳහා ද මහ කන්නයේ දී සාපේක්ෂව වැඩි බිම් ප්‍රමාණයක් (20 ගුණයක්) යොදා ගෙන ඇති බව පෙනේ. නමුත් මුං‍ඇට හා රටකජු වගාකිරීම සඳහා මහ කන්නයට වඩා වැඩිබිම් ප්‍රමාණයක් යල කන්නයේදී භාවිතා කර ඇති බව පෙනී යයි. මුල්‍ය භෝගයක් වන මිරිස් වගාකිරීම සඳහා මහ කන්නයේ මෙන් තුන් ගුණයක පමණ භූමියක් යල කන්නයේදී භාවිතයට ගැනේ. යල කන්නයේ දී ලැබෙන ජලය අඩුවීම හේතුවෙන් බොහොමයක් කුඹුරුවල වී වෙනුවට වෙනත් ගැලපෙන භෝග වගාකිරීම මෙයට හේතුවයි.

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්න 1982 සිට 1991 දක්වා වෙනස් වී ඇති අන්දම පහත වගුවේ පෙන්නුම් කර ඇත.

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදන වල අස්වැන්න. හෙක්ටයාරයට කි. ග්‍රෑම් වලින්

| භෝගය / වර්ෂය | | වී | බඩ ඉරිඟු | මුං ඇට | රටකජු | මිරිස් | වර්ෂා පතනය මි. මී. | වැසි දින ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| 1982 | මහ | 3988 | 849 | 707 | 333 | 1091 | 1630 | 72 |
| | යල | 3447 | - | 621 | 280 | 1131 | | |
| 1985 | මහ | 4317 | 1235 | 1172 | 955 | 6006 | 1533 | 83 |
| | යල | 3894 | 1298 | 1087 | 969 | 4976 | | |
| 1988 | මහ | 3813 | 1020 | 1063 | 826 | 5503 | 1125 | 63 |
| | යල | 3636 | 878 | 773 | 666 | 3893 | | |
| 1989 | මහ | 3751 | 854 | 1062 | 823 | 5231 | 1247 | 73 |
| | මහ | 3616 | 868 | 820 | 689 | 3618 | | |
| 1990 | මහ | 4026 | 655 | 1049 | 783 | 5386 | 1176 | 76 |
| | යල | 3367 | 943 | 793 | 936 | 6008 | | |
| 1991 | මහ | 3894 | 804 | 1053 | 774 | 5376 | | |
| | යල | 3513 | 833 | 816 | 714 | 5638 | | |

*මූලය : සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ඉහත වගුවට අනුව වී හැරුණු විට, අනෙකුත් භෝග අස්වැන්නේ සැළකිය යුතු වැඩිවීමක් 1982 න් පසු පෙන්නුම් කර තිබේ. එමෙන්ම පොදුවේ සලකා බලන විට 1985 වර්ෂයේ ඉහත සඳහන් සියළුම භෝග වල වාර්තාගත ඉහළ අස්වැන්නක් ලැබී ඇති බව පෙනේ. එම වර්ෂයේ වර්ෂාපතනය අගයයන් සහ එහි ව්‍යාප්තිය මේ තත්ත්වයට විශේෂ දායකත්වයක් දී ඇති බව පෙනේ.

අනෙකුත් දිස්ත්‍රික්ක වල මෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ද යල කන්නයට වඩා වැඩි වී අස්වැන්නක් මහ කන්නයේ දී පෙන්නුම් කර ඇත. උපරිම අස්වැන්න වන හෙක්ටයාරයට කි. ග්‍රෑම් 4317 ලැබී ඇත්තේ 1985 මහ කන්නයේ දී ය. අවම අස්වැන්න (3367) ලැබී ඇත්තේ 1990 යල කන්නයේදීය.

උපරිම බඩඉරිඟු අස්වැන්න (1298) පෙන්නුම් කර ඇත්තේ 1985 යල කන්නයේ දී වන අතර අවම අස්වැන්න (655) ලැබී ඇත්තේ 1990 මහ කන්නයේ දී ය. සාමාන්‍යයෙන් යල කන්නයේ දී අස්වැන්න මහ කන්නයට වඩා වැඩි බව පෙනේ. මීට හේතුව බඩඉරිඟු යල භෝගයක් ලෙස පෙනී සිටීමයි.

උපරිම මුංඇට අස්වැන්න (1172) ලැබී ඇත්තේ 1985 මහ කන්නයේදීය. අවමය (774) ලැබී ඇත්තේ 1988 යල කන්නයේදී ය. මුං ඇට නිෂ්පාදනය සඳහා යල කන්නයට වඩා මහ කන්නය හිතකර වී තිබෙන බව පෙනේ.

රටකජු නිෂ්පාදනයේ උපරිම අස්වැන්න (969) හා අවම අස්වැන්න (666) ලැබී ඇත්තේ පිළිවෙලින් 1985 හා 1988 යල කන්නවලදී ය. එහි අස්වැන්න කෙරෙහි වගා කන්නය එතරම් බලපෑමක් නොකරන බව පැහැදිලි වේ.

උපරිම මිරිස් අස්වැන්න (6008) හා අවම අස්වැන්න (3618) ලැබී ඇත්තේ පිළිවෙලින් 1990 හා 1989 යල කන්නවලයි. මුල්‍ය භෝගයක් වශයෙන් යල් කන්නයේ දී එයින් ගොවීන්ට හොඳ ආදායමක් ලබාදෙයි.

දැනටත් විශාල වශයෙන් කෘෂි නිෂ්පාදන දායකත්වයක් ඇති පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් තවදුරටත් දිරිමත් කිරීමට කටයුතු කළහොත් වඩා වැඩි ගොවි සහභාගිත්වයකින් යුතුව සම්පත් උපරිම වශයෙන් යොදාගනිමින් ප්‍රශස්ථ ලෙස නිෂ්පාදන කටයුතු කිරීමට ඔවුහු උනන්දුවනු ඇත.